සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

සමාජ සවිබලගැන්වීම්, සුබසාධන හා කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යාංශය
சமூக வலுவூட்டல் நலன்புரி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT, WELFARE AND KANDYAN HERITAGE


**2013 අංක 01 දරණ සමෘද්ධි පනතහි 33(9) වගන්තිය**

**ප්‍රකාර සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩල අනුමැතිය යටතේ**

**නිකුත් කරනු ලබන විධානය :- 2018/05**

## ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින්, දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන - 2018

**1. හැඳින්වීම.**

2018 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින්, සමෘද්ධි ප්‍රජා මූල බැංකු හරහා දිරියමාතා ඉතුරුම් තැන්පතු ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කරනු ලබයි.

දිරිය කාන්තාව / ගෘහණිය ගෘහ පාලනය හරහා සකසුරුවමට මුල්තැන ලබාදෙන අතර, එම ආදර්ශය තවදුරටත් පෝෂණය කරමින් ඉතුරුම් තැන්පතු අංශයෙන් ඇයව නව මගකට යොමුකර, ඔවුන්ගේ ආර්ථික තත්වය තිරසාර කිරීමටත්, එහි ආර්ථික ප්‍රතිලාභ රටක සංවර්ධනයට යොමු කිරීමට දිරියමාතා ගිණුම් සඳහා තැන්පතු රැස්කිරීමටත්, නව ගිණුම් ආරම්භ කිරීමට යොමු කිරීම මෙම ප්‍රවර්ධන වැඩසටහනින් අපේක්ෂා කෙරේ.

**2. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන**

2.1. දීප ව්‍යාප්ත සමෘද්ධි ප්‍රජා මූල බැංකු 1074 පුරා ඉතුරුම් වැඩසටහන දියත් කළ යුතුය. මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන දිරියමාතා ඉතුරුම් තැන්පතු ගිණුම් සඳහා පමණක් තැන්පතු රැස්කරන අතර, එමඟින් සමස්ථ රු. මිලියන **275** ක තැන්පතු රැස්කිරීමට අපේක්ෂිතය.

2.2. සමස්ථ ඉලක්කය සමෘද්ධි ප්‍රජා මූල බැංකු අතර සමානුපාතිකව බෙදී යන අතර, එක් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක් අවම වශයෙන් රු**. 250,000/-** ක තැන්පතු මුදලක් රැස් කිරීමට කටයුතු කල යුතුය.

2.3. දීප ව්‍යාප්තව දිරියමාතා ඉතුරුම් ගිණුම් **20000** අළුතින් ආරම්භ කිරීමට ඉලක්ක කරන අතර, අඩු ආදායම්ලාභී පවුල් වල කාන්තාවන් ඇතුළු සියළුම කාන්තාවන් ඉලක්ක කර මෙම ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කල යුතුය. මෙහි දී එක් එක් සමෘද්ධි ප්‍රජා මූල බැංකුවක් අළුතින් දිරියමාතා ගිණුම් **20** ක් ආරම්භ කිරීමට ඉලක්ක කල යුතුය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya ,Battaramulla**

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel- 011-2873802/2872202
Fax - 011-2889002
E-mail-dg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (මානව සම්පත්)
பணிப்பாளர் ( மனிதவளம்)
Director (Human Resource)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk
**Hot Line : 0112-889007**

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
பணிப்பாளர் (குறு நிதி )
Director ( Micro Finance)
011-2889003
011-2887469
**Hot Line:0112-885582**

කාර්යාලය
அலுவலகம்
Office
011-2887280
**Hot Line: 011- 2887722**

2.4. ජාතික ඉලක්ක සපුරා ගැනීමට එක් එක් සමෘද්ධි ප්‍රජා මූල බැංකු සඳහා ඉලක්ක දී ඇති අතර, එම ඉලක්ක සාර්ථකව සපුරා ගැනීමට බැංකු බල ප්‍රදේශයට අයත් සියලුම වසම් සඳහා ඉලක්ක සකස් කර ලබා දිය යුතුය.

2.5. සමෘද්ධි ප්‍රජා මූල බැංකු වල ඉලක්ක, එකතු කර සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතියේ ඉලක්කය සකස් කර ගත යුතුය.(සමෘද්ධි ප්‍රජමූල බැංකු සමිතියට අයත් සියලුම සමෘද්ධි බැංකුවල ඉලක්කවල එකතුව)

**3. ප්‍රවර්ධන වැඩසටහනෙහි කාල සීමාව**

**2018** මාර්තු **08** දින සිට **20** දක්වා කාලය පුරාවට ප්‍රවර්ධන වැඩසටහන දියත් කර ඉලක්ක සපුරා ගත යුතුය.

**4. ප්‍රචාරණ වැඩසටහන හා සමරු තිළිණ ලබාදීම.**

4.1. ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන පිළිබඳ ජනතාව දැනුවත් කිරීම ක්ෂේත්‍ර නිලධාරීන් හා ප්‍රජා මූල සංවිධාන නායකයින් හරහා සිදුකල යුතුය. තවදුරටත් දැනුවත් කිරීමට අපේක්ෂා කරන බැංකු සඳහා අත්පත්‍රිකාවක් මුද්‍රණය කර බෙදාහැරීමට ඉඩදෙනු ලැබේ. ඒ සඳහා සමෘද්ධි ප්‍රජා මූල බැංකුවකින් රු. 3000.00 උපරිම මුදලක් වියදම් කර, වැය ගිණුම - බැංකු ප්‍රවර්ධන ගිණුමට හර කර සටහන් තැබිය යුතුය.

4.2. ප්‍රචාරණ අත් පත්‍රිකාව සියලුම බැංකු වෙනුවෙන් මුද්‍රණය කිරිම සම්බන්ධීකරණය සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය සිදුකල යුතුය. අත් පත්‍රිකා මුද්‍රණය කර බෙදා හැරිම අත්‍යවශ්‍යම නොවේ.

4.3. මෙම ඉතුරුම් වැඩසටහන යටතේ දැනටමත් පවතින දිරියමාතා ඉතුරුම් ගිණුමකට හෝ නව දිරියමාතා ගිණුමක් ආරම්භ කරන ගිණුම් සඳහා ඉතුරුම් කරන මුදල අනුව ගිණුම් හිමියන්ට සමරු තිළිණයක් ලබාදීමට හැක. සමරු තිළිණ වෙනුවෙන් බැංකුව උපරිම රැස් කරන මුළු තැන්පත් මුදලින් 5% නොඉක්ම වූ මුදලක් බැංකු අරමුදලින් වැය කිරීමට අවසර ඇත. මෙහිදී එක් එක් ගිණුම් හිමියා ප්‍රවර්ධන සතිය තුල තැන්පත් කරන මුදල අනුව වෙනස් වූ සුදුසු සමරු තිළිණයක් ලබාදීම පිළිබඳ තීරණයක් ගැනීම කළමනාකරු ඇතුළු පාලක මණ්ඩලය වෙත පැවරේ. සමහර සමෘද්ධි බැංකු එක් එක් ගිණුම් හිමියා තැන්පත් කරන මුදලට 5% ක් හෝ ඊට වැඩි වටිනාකමක් ඇති සමරු තිළිණයක් ලබාදීම සිදු කරන බව නිරීක්ෂණය වේ.එසේ නොකළ යුතු බව අවධාරණය කරමි.

4.4. 2018 මාර්තු 08 දිනසිට 20 දක්වා දිරියමාතා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන යටතේ තැන්පත් කරන මුදල්, බැංකුව තුල අවම වශයෙන් මාස 12 ක් රඳවා ගැනීම සඳහා කටයුතු කල යුතුය. සමරු තිළිණ ලබා ගැනීමේ අපේක්ෂාවෙන්, මුදල් තැන්පත් කර කෙටි කලකින් ආපසු ලබා ගැනීමට කටයුතු කරන ගිණුම් හිමියන් සිටින බව ද වාර්තා වී ඇති බව දන්වන අතර, එම තත්ත්වය වලක්වා ගැනීමට කටයුතු කිරීම කළමනාකරුගේ වගකීමක් බව ද සඳහන් කරමි. මේ නිසා මේ සම්බන්ධව බැංකු කාර්යය මණ්ඩලය විශේෂ අවධානය යොමු කිරීම කල යුතුය.

4.5. සමරු තිළිණ තෝරාගැනීම හා මිලදී ගැනීම ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව හරහා සිදුකල යුතුය. තවද සමරු තිළිණ තෝරා ගැනීමේ දී බැංකුවට ප්‍රචාරණ සහයෝගයක් හා සමෘද්ධි බැංකු වැඩසටහනේ කීර්තිනාමය ප්‍රචලිත වන අයුරින් සිදුකල යුතුය.

4.6. සමෘද්ධි ප්‍රජාමූල බැංකු සඳහා ක්‍රියාත්මක වන ඇගයීම් වැඩසටහන හා ශ්‍රේණිගත (Grading) කිරීමේදී මෙවැනි ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් තුලදී ඉලක්ක සපුරා ගැනීමට දක්වන උනන්දුව කෙරෙහි විශේෂ අවධානය යොමු කරන බවද දන්වමි.

4.7 මෙම වැඩසටහන යටතේ ගිණුම් හිමියන් තිළිණ ලබාගැනීමේ අරමුණින් සාමාජික තැන්පත් ගිණුමේ ඇති තැන්පතු මුදල් දිරියමාතා තැන්පත් ගිණුමට මාරු කිරීමට ඇති ඉඩකඩ අහුරාදැමිය යුතුය. තවද, ඉලක්ක සපුරාගැනීමේ අරමුණින් බැංකු ණය වැඩසටහන් යටතේ ණය ලබාදී, එම මුදල් නැවත වරක් දිරියමාතා තැන්පතු ගිණුමේ තැන්පත් කිරීමට පෙළෙඹෙන අවස්ථා වැළක්වීමට පියර ගත යුතුය.

**5. ප්‍රගති වාර්තා ලබාදීම.**

5.1. ඇමුණුම 01 හි සඳහන් ආකෘතිය නිසිලෙස සම්පූර්ණ කර ප්‍රගතිය 2018/03/28 ට පෙර ප්‍රජා මූල බැංකු සමිතියට ලබාදිය යුතුය.

5.2. සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිති විසින් බැංකු වලින් ලබාගත් ප්‍රගතිය 2018/04/05 ට පෙර ඇමුණුම් - 02 හි සඳහන් පරිදි සකස් කර දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ වෙත යොමු කල යුතුය.

5.3. දිස්ත්‍රික් සමෘද්ධි අංශය විසින් 2018/04/12 ට පෙර සියලුම ප්‍රජා මූල බැංකු වල ප්‍රගතිය ඇමුණුම 02 හා පරිදි සකස් කර ප්‍රජා මූල බැංකු අංශයට කඩිනමින් ලබාදිය යුතුය.

**ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න,**
**සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරන මණ්ඩලයේ සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.**

ඇමුණුම **- 01**

**2018** මාර්තු **08** ජාතික කාන්තා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ

දිරියමාතා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය

**..........................................** සමෘද්ධි ප්‍රජා මූල බැංකුව

| විස්තරය | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු.) * | වෙනත් |
|---|---|---|---|
| අළුතින් ආරම්භ කරන ලද<br>දැනට ක්‍රියාත්මක ගිණුම් සඳහා රැස්කරන ලද | | | |
| **එකතුව** | | | |

* ඒ ඒ ඉලක්ක වෙනුවෙන් රැස්කරන ලද තැන්පත් මුදල සඳහන් කල යුතුය.

සහතික කලේ

නම :- ...................................................

අත්සන :- ...................................................

දිනය :- ...................................................

---

ඇමුණුම **- 02**

**2018**මාර්තු **08** ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව ක්‍රියාත්මක වූ

දිරියමාතා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනෙහි ප්‍රගතිය

**................................................** සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය **/** දිස්ත්‍රික්කය

| බැංකුවේ නම | අළුතින් ආරම්භ කරන ලද | | දැනට පවතින ගිණුම් සඳහා රැස්කරන ලද තැන්පතු | | එකතුව | |
|---|---|---|---|---|---|---|
| | ගිණුම් සංඛ්‍යාව | රැස්කරන ලද තැන්පතු මුදල (රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල(රු.) | ගිණුම් සංඛ්‍යාව | තැන්පතු මුදල(රු.) * |
| | | | | | | |
| | | | | | | |
| **එකතුව** | | | | | | |

* **රැස්කරන ඉහළම තැන්පතු මුදලෙහි සිට අඩුම මුදලක් රැස්කරන බැංකුව දක්වා, පෙලගස්වා වාර්තාව සකස් කල යුතුය.**

සහතික කලේ

නම :- ...................................................

අත්සන :- ...................................................

දිනය :- ...................................................